*පටිත:*
*සමාජ සංස්කෘතික සමීක්ෂා*

# ප්‍රවේශාත්මක ලිපි

ප්‍රවේශාත්මක ලිපි යන්නනෙන් අප අදහස් කරන්නේ, යම්කිසි න්‍යායික ප්‍රවේශයක්, නැතහොත් ශිල්පක්‍රමික හෝ විධික්‍රමික භාවිතයක් පිළිබඳව ලියන ලද සවිස්තරාත්මක රචනයකට ය. වඩාත් පැහැදිලි කරන්නේ නම්, එමගින් සිදුවිය යුත්තේ, තෝරාගත් විශය කරුණ මැනැවින් විස්තර කිරීම සහ එම න්‍යායික ප්‍රවේශය හෝ ශිල්ප ක්‍රමය ශ්‍රී ලාංකේය සමාජයීය විද්‍යාවන් ට හෝ මානව ශාස්ත්‍රවලට ප්‍රයෝජනවත් වන්නේ කෙසේදැයි යෝජනා කිරීමය. එනම්, මෙරට සිංහල භාෂාවෙන් පුළුල් ලෙස සාකච්ඡාවට භාජනය වී නැති න්‍යායික, සංකල්පමය හෝ විධික්‍රමික අදහස් සාකච්ඡාවට භාජනය කිරීමට ආරම්භයක් සැපයීමය.

උදාහණයක් වශයෙන්, ඔබට අවශ්‍ය පශ්චාත්-යටත්විජිත න්‍යායික ප්‍රවේශය (post colonial theory) පිළිබඳ රචනයක් ලිවීමට යයි සිතමු. එසේනම්, පරමාදර්ශීය ව පහත සඳහන් ආකාරයේ කරුණු මේ සඳහා ආවරණය විය යුතුය. ප්‍රථමයෙන්ම, පශ්චාත්-යටත් විජිත ප්‍රවේශය ආරම්භ වූයේ එතෙක් පැවති න්‍යායික ප්‍රවේශවල කුමන දුර්වලතා ආමන්ත්‍රණය කිරීමටද? දෙවනුව, ගොලීය වශයෙන් ගත් කළ, එම න්‍යායික ප්‍රවේශය බුද්ධි කලම්භනය සඳහා මුලින්ම යොදාගනු ලැබුවේ කුමන ශික්ෂණවල ද? ඊට හේතුව කුමක්ද? පසුව, එය අන් ක්ෂේත්‍ර වෙත සංක්‍රමණය වූයේ කෙසේද? තෙවනුව, පශ්චාත් යටත්විජිත න්‍යායික ප්‍රවේශය විස්තීරණය කිරීමට දායකවූ කතුවරු කවුරුන්ද සහ ඔවුන්ගේ කේන්ද්‍රීය රචනා මොනවාද? ඒ රචනාවල මුඛ්‍ය අදහස් මොනවාද? සිව්වනුව, ශ්‍රී ලංකාවේ සමාජීය විද්‍යා හා මානව ශාස්ත්‍ර යන පුළුල් විෂය ක්ෂේත්‍ර තුළ මේ ප්‍රවේශයය ගැඹුරු මට්ටමින් දැකගත නොහැක්කේ කුමක් නිසාද? පස්වනුව, මේ න්‍යායික ක්ෂේත්‍රය ශ්‍රී ලංකාවේ බුද්ධි කලම්භනය සඳහා යොදාගත හැකිද? එසේ කිරීමෙන් ඇති ප්‍රයෝජනය කුමක්ද? මෙවන් මූලික කරුණු ගණනාවක් ආවරණය කළහොත්, සාර්ථක ප්‍රවේශාත්මක ලිපියක් ලිවීමට හැකිවනු ඇති බව අපගේ විශ්වාසයයි.

මේ මූලික අත්වැල හැරෙන්නට ප්‍රවේශාත්මක රචනයක් ලිවීමට සුවිශේෂ ආකෘතියක් යෝජනා කිරීට අපගේ කැමැත්තක් නැත. නමුත් අවම වශයෙන්, සාකච්ඡාවට භාජනය වන ප්‍රධාන කාරුණ හා එහි බුද්ධිමය ඉතිහාසය සහ එය තත්කාලීන ශ්‍රී ලාංකේය භාවිතයට ප්‍රයෝජනවත් විය හැක්කේ කුමක් නිසාද, නැතහොත් එසේ අවශ්‍ය වන්නේ ද යන ප්‍රධාන ප්‍රශ්න දෙකට මෙවන් ලිපියකින් පිළිතුරු සැපයිය යුතුය.

මූලික වශයෙන් ප්‍රවේශාත්මක ලිපියක් ශාස්ත්‍රීය ලිපියකි. එම නිසා, ශාස්ත්‍රීය ලිපි සම්පාදනයේ දී සාමාන්‍යයෙන් ජාත්‍යන්තරව අනුගමනය කරන විධික්‍රම හා ශෛලීන් මෙහිදී ද අනුගමනය කළ යුතු ය. *පටිත: සමාජ සංස්කෘතික සමීක්ෂා* සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු භාෂා ශෛලීන් සහ තොරතුරු මූලාශ්‍ර සටහන් කිරීම පිළිබඳ කරුණු පටිත වෙබ් අඩවියේ පහත සබැඳියාවෙන් ලබාගත හැක: http://www.patitha.lk/wp-content/uploads/2019/12/%E0%B7%83%E0%B6%B8%E0%B7%8F%E0%B6%A2%E0%B7%93%E0%B6%BA-

%E0%B7%80%E0%B7%92%E0%B6%AF%E0%B7%8A_%E0%B6%BA%E0%B7%8F-%E0%B6%BD%E0%B7%92%E0%B7%80%E0%B7%93%E0%B6%B8-2012-1-4-60-91.pdf

පඨිත සඳහා ඉදිරි ඉදිරිපත් කරන ප්‍රවේශාත්මක ලිපියක් වචන 5500 සිට 7000 දක්වා විය යුතුය. ඒ සියළුම මූලාශ්‍ර සටහන් හා පාදක සටහන් ද ඇතුළුවය. අමතර තොරතුරු අවශ්‍ය නම් කරුණාකර පහත සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනයට ලියන්න: patithaj@gmail.com

පඨිත අන්තර්ජාල සංස්කරණය කියවීමට, පඨිත හා සම්බන්ධ ප්‍රතිපත්ති හා ලිපි සම්පාදනයේදී අනුගමනය කළ යුතු මූලික කරුණු සඳහා පඨිත වෙබ් අඩවියට පිවිසෙන්න: http://www.patitha.lk/

**පඨිත සංස්කාරක මණ්ඩලය**
**2020**
http://www.patitha.lk/